# ප්‍රධාන අමාත්‍යාංශය

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ,ආදායම් පරීක්ෂක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 2014.06.04 දිනට අනුමත ආදායම් පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටියේ විධිවිධාන ප්‍රකාරව විවෘත පදනම යටතේ බඳවා ගැනීමට මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**01). සාමාන්‍ය සුදුසුකම් :-**

i. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
ii. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය
iii. 2026.07.31 දිනට වයස අවුරුදු 18ක් සම්පූර්ණ විය යුතු අතර, එදිනට වයස අවුරුදු 30 නොඉක්මවිය යුතුය.
iv. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට එනම් 2026.07.31 දිනට පූර්වාසන්න වසර 03ක් අයදුම්කරු හෝ අයදුම්කරුගේ කලත්‍රයා සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මඟින් පදිංචිය සනාථ කළ යුතුය.)
v. සෑම අපේක්ෂකයෙකුම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**02). අධ්‍යාපන සුදුසුකම්:-**

i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

හා

ii. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයක්වත්(සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත්ව තිබීම.

**03). බඳවා ගන්නා ක්‍රමය :-**

**3.1)** විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලබයි.
පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අපේක්ෂකයන්ගේ රාජකාරී කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස, ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතව පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන්ගේ ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම සුදුසුකම් සපුරන්නන්ගෙන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**3.2). සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

I. ඉහත 3.1 අනුව තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා ආදායම් පරීක්ෂක තනතුරට බඳවා ගැනීමට අදාළව මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වන අතර එහිදී ලකුණු ලබා දීමක් සිදු කරනු නොලැබේ.
II. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් හෝ සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික පත්‍රයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

**4). සේවා කොන්දේසි :-**

I. පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, ආදායම් පරීක්ෂක බඳවා ගැනීම් පරිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන් මගින් පනවා ඇති කොන්දේසි වලටද, එම බඳවා ගැනීම් පරිපාටියෙහි මින් මතුවට කෙරෙන සංශෝධනවලටද, යටත්ව තෝරාගනු ලබන අයදුම්කරුවන් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබේ.

II. මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

III. මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

IV. සෑම පත්වීම්ලාභියෙකුම 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව හා එයට වරින් වර සිදු කරනු ලබන සංශෝධනයන්ට අනුව දෙවන රාජ්‍ය භාෂාව පළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

**5) පුරප්පාඩු ගණන :- 23**

**6) වැටුප් පරිමාණය :-**

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව මෙම තනතුරට MN-01/2025 වැටුප් ඛණ්ඩය හිමිවන අතර මාසික වැටුප් පරිමාණය රු:45,230-10X540-11X630-10X890-10X1,190-78,361/-වේ.

**7) අයදුම් කිරීමේ ක්‍රමය :-**

අයදුම්පත්‍ර මෙම නිවේදනයට අදාළ ඇමුණුම 01 හි සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර තම අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, හා අසම්පූර්ණ ලෙස තොරතුරු සටහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

I. එක් අයදුම්කරුවෙකු එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබී ඇති බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

II. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

III. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.07.31 දිනට හෝ ඊට පෙර **"ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,සබරගමුව පළාත් සභාව, නව නගරය,රත්නපුර"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ,ආදායම් පරීක්ෂක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026** යනුවෙන් අනිවාර්යෙන්ම සඳහන් කළ යුතුය.

**8) විභාග පරිපාටිය : -**

I. මෙම නිවේදනයේ 1 හා 2 හි සඳහන් කොන්දේසිවලට අනුව සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන් හට පමණක් සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයා එහි තම අත්සන 7. II හි සඳහන් සුදුසුකම් ලත් අයෙකු විසින් සහතික කරවා ගත යුතු අතර, විභාගයට පෙනී සිටින දිනයේ විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත සිය අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. විභාග දිනයේදී ප්‍රවේශ පත්‍රය හා තම අනන්‍යතාවය තහවුරු නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් සබරගමුව පළාත් සභා වෙබ් අඩවියේ පළ කරනු ඇත.

II. අපේක්ෂකයෙකු තමන්හට නියම කරන ලද විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

III. විභාග මධ්‍යස්ථානයේදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලබන බව සැලකිය යුතුය.

IV. මෙම විභාගය සිංහල හා දමිළ භාෂා මාධ්‍ය වලින් පමණක් පවත්වනු ලැබේ. අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට අයදුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

V. විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය,තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| භාෂා හැකියාව | පැය 01 | 100 | 40% | අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය,භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

VI . මෙම තරඟ විභාගයෙන් සමත්වීම සඳහා එක් එක් විෂය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) ක් අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) ක් ලබා ගත යුතු වේ. පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා තරඟ විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පෙළගස්වා ඉන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් තෝරාගනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඔවුන් අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා අදාළ පත්වීම් ලබා දීම සිදු කරනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලැබේ.

**09).** විභාග ගාස්තුව :-

I. විභාග ගාස්තුව රු.1200/-කි. මෙම විභාග ගාස්තුව කිසිදු හෝ හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

II. සබරගමුව පළාත තුළ අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ අංක 20.02.02.99 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කර එවිය යුතුය.

**10).** කිසියම් අයදුම්කරුවෙකු නියමිත සුදුසුකම් සපුරා නොමැති බව පත්වීම් ලැබීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අයදුම්පත කිසිදු හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද නියමිත සුදුසුකම් පිළිබඳව දැන දැනම හෝ ඕනෑකමින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව හෝ පත්වීම් ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් හෝ පත්කිරීම සඳහා නුසුදුසු බව හෝ අනාවරණය වුවහොත් ,වහාම රජයේ සේවයෙන් පහ කරනු / සේවය අවසන් කරනු ලැබේ.

**11).** මෙම චක්‍රලේඛය හා බඳවා ගැනීම් පටිපාටිය අතර යම් අනනුකූල බවක් ඇති වුවහොත් එහිදී බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන බලාත්මක වේ. පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී සියලුම පුරප්පාඩු හෝ ඉන් කොටසක් සම්පූර්ණ කිරීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද සබරගමුව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් වෙත බලය ඇත.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

පිටපත්: පළාත් පාලන කොමසාරිස් - කාරු.දැ.ගැ.පි.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

| |
|---|
| |

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක තනතුරෙහි iii ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2026**

1). ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..........................................................................................

2). ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ...........................................................................

3). විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍ය :-

| සිංහල | | දෙමළ | |
|---|---|---|---|

(√ ලකුණ යොදන්න)

4) 4.1. සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් (උදා:- DISSANAYAKA MUDIYANSELAGE SAMAN)

..........................................................................................................................

4.2. මුලකුරු සමඟ නම -: (උදා : SAMAN.D.M)

..........................................................................................................................

4.3) සම්පූර්ණ නම:- ( සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................
..........................................................................................................................

5).5.1 වර්තමාන ලිපිනය: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)
..........................................................................................................................
..........................................................................................................................

5.2 වර්තමාන ලිපිනය :- (සිංහලෙන් / දෙමළෙන්).............................................................................
..........................................................................................................................

6) 6.1 දුරකථන අංකය -: ජංගම.......................................නිවස..................................................

7) 7.1 ජාතික හැඳුනුම්පත් අංකය -:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

7.2. උපන් දිනය -: වර්ෂය

| | | | |
|---|---|---|---|

මාසය

| | |
|---|---|

දිනය

| | |
|---|---|

7.3.2026.07.31 දිනට වයස අවු ................ මාස................. දින..................

7.4. ස්ත්‍රී / පුරුෂ භාවය-: ...................  7.5. විවාහක/අවිවාහක බව -:....................................

7.6 2026.07.31 දිනට අයදුම්කරු හෝ කලත්‍රයා සබරගමුව පළාත තුළ පදිංචි කාලය -:.............................
(අවම වසර 03කට වැඩි විය යුතුය)

8) අධ්‍යාපන සුදුසුකම් -: (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද සහතිකපත්‍රයන්හි තමා විසින්ම සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.)

**8.1) අ.පො.ස සා/පෙළ විභාග ප්‍රතිඵලය**

( අ) පෙනී සිටි වර්ෂය .................... විභාග අංකය...................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

(ආ) අ.පො.ස උ/පෙළ විභාග ප්‍රතිඵලය

පෙනී සිටි වර්ෂය...................... .................................විභාග අංකය...............................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

9) 9.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්):-...............................

9.2 කුවිතාන්සියේ අංකය:-...............................................................

9.3 නිකුත් කළ කාර්යාලය ............................................. 9.4 දිනය.......................................

කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න

**10) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය:-**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසම්පූර්ණ හෝ අසත්‍ය බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, පසුව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.............................
දිනය

.......................................................................
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

**06) අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...............................................................................මහතා / මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවද, ඔහු/ඇය.................................වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ නම :-.................................................................

අත්සන :-..............................

තනතුර හා නිල මුද්‍රාව :-

(රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුයි.)